සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

අවසාන වාර පරීක්ෂණය - 2025
இறுதி தவணைப் பரீட்சை - 2025 / Year End Term Test - 2025

ශ්‍රේණිය / தரம் / Grade: 6 ශ්‍රේණිය	බුද්ධ ධර්මය I - II	කාලය / நேரம் / Time: පැය 02 යි

නම / பெயர் / Name: ..... විභාග අංකය / சுட்டிலக்கம் / Index No: .....

I පත්‍රය

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- 1 සිට 20 දක්වා ප්‍රශ්න සඳහා දී ඇති පිළිතුරු අතුරෙන් ගැළපෙන හෝ වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

---

1. සිදුහත් කුමරු මවුකුස පිළිසිඳ ගත්තේ කුමන පෝය දිනක ද?
   (1) වෙසක් පෝය දින (2) පොසොන් පෝය දින
   (3) ඇසළ පෝය දින (4) නිකිණි පෝය දින

2. සුද්ධෝධන රජතුමා සිදුහත් කුමරුට දෙවන වරට වැන්දේ,
   (1) අසිත තාපසතුමා කුමරුට වැන්ද අවස්ථාවේදී ය.
   (2) වප් මඟුල් උත්සවයේ දී කුමරු ආනාපානාසති භාවනාව වැඩි අවස්ථාවේ දී
   (3) බුදු වී පළමුවරට කිඹුල්වත් නුවර වැඩි අවස්ථාවේ දී ය.
   (4) ශිල්ප දැක්වූ අවස්ථාවේ දී ය.

3. සිදුහත් කුමරුගේ විවාහය සිදු වූයේ වයස අවුරුදු
   (1) 31 දීය. (2) 29 දීය. (3) 16 දීය. (4) 12 දීය.

4. චුල්ල රාහුලෝවාද සූත්‍රය අසා රහත් භාවයට පත් වූයේ,
   (1) යශෝධරා දේවිය (2) සුද්ධෝදන රජතුමා (3) රාහුල කුමරු (4) මහාමායා දේවිය

5. අත්ථස්සද්වාර ජාතකය මගින් පැවසෙන්නේ,
   (1) පිරිහීමේ දොරටු පිළිබඳවය. (2) ඉවසීම පිළිබඳව ය.
   (3) කෝපයේ ආදීනව පිළිබඳව ය. (4) දියුණු වීමේ දොරටු පිළිබඳව ය.

6. අලීනතාව යනු,
   (1) අලස බවය. (2) අලස නැතිකම ය.
   (3) කරුණු හරි හැටි නොදන්නා බවය. (4) අසමාදී බවය.

7. ත්‍රිකෝටි පාරිශුද්ධි ශීලය යනු,
   (1) පන්සිල් ය. (2) අටසිල් ය.
   (3) දස සිල් ය. (4) අංශ තුනකින් ආරක්ෂා වූ සිල් පදයන්ය.

Past Papers Wiki

8. ජාතික කොඩියේ කොළ සහ තැඹිලි පැහැති සිරස් පටි දෙකින් පෙන්නුම් කරනුයේ,
   (1) සතර බ්‍රහ්ම විහරණය. (2) සුළු ජාතීන්ය.
   (3) ජාතීන් අතර එකමුතුවයි. (4) නිර්භීතකමය.

9. "නතං කම්මං කතං සාධූ" ගාථාව දේශනා කරන ලද්දේ කවුරුන් අරභයා ද?
   (1) අසරණ ගොවියෙකුට (2) රජ්ජුමාලාවන්ට
   (3) සුමන මාලාකරුට (4) අංගුලිමාලට

10. තුන්වන ධර්ම සංගායනාව පවත්වන ලද්දේ බුදුරජාණන් වහන්සේ පිරිනිවන් පා වසර කීයක දී ද?
   (1) 300 යි. (2) 200 යි. (3) 570 යි. (4) 236යි.

11. මිහිඳු මා හිමියන් සමඟ ශ්‍රී ලංකාවේ ධර්ම ප්‍රචාරයට පැමිණි පිරිස අතර සිටි සාමණේරයන් වහන්සේ,
   (1) ඉත්තීය වේ. (2) සුමන වේ. (3) භද්දසාල වේ. (4) උත්තිය වේ.

12. ශ්‍රී ලංකාවට බුදු දහම ලැබීමෙන් පසුව ඉදිකළ ප්‍රථම ස්තූපය වූයේ,
   (1) අභයගිරිය (2) ථූපාරාමය (3) මිරිසවැටිය (4) රුවන්වැලි සෑය

13. මෙරට භික්ෂුණී ශාසනය ආරම්භ කරන ලද්දේ ..... පෝ දිනය.
   (1) බිනර (2) ඇසළ (3) උඳුවප් (4) පෙසොන්

14. ශ්‍රී මහා බෝධි ශාඛාව රැගත් සඟමිත් තෙරණිය මෙරටට ගොඩ වූයේ කුමන වරායකින් ද?
   (1) ත්‍රිකුණාමල වරායෙන් (2) ගාල්ල වරායෙන්
   (3) යාපනය වරායෙන් (4) හම්බන්තොට වරායෙන්

15. සම්පත් ආරක්ෂා කර ගැනීමට අදාළ උපදෙස් ප්‍රධාන වශයෙන් ඇති සූත්‍රය වනුයේ කුමක්ද?
   (1) සිගාලෝවාද සූත්‍රය (2) රතන සූත්‍රය (3) අංගුලිමාල සූත්‍රය (4) කූල සූත්‍රය

16. 'දැඩි ලෝබය දුකට හේතු වේ' යන්න තේමාව කරගත් කථා වස්තුව වූයේ,
   (1) මහා රාහුලෝවාද සූත්‍රය (2) අත්ථස්සද්වාර ජාතකය
   (3) අසරණ වූ ගොවියාගේ කතාව (4) ස්වර්ණ හංස ජාතකය

17. ජාතිස්මරණ ඥානය යනු,
   (1) පෙර ගත කළ ආත්මයන් පිළිබඳ දැන ගැනීමේ නුවණ
   (2) අන් අයගේ සිත් පිළිබඳ දැන ගැනීමේ නුවණ
   (3) පරචිත්ත විජානන ඥානය
   (4) තමාගේ ජාතිය පිළිබඳ දැන ගැනීමේ නුවණ

18. අමූලික ශ්‍රද්ධාව පිළිබඳ කියවෙන ජාතක කථාව වනුයේ,
   (1) අසරණ ගොවියාගේ කථාව (2) නිදි නොලැබූ උපාසක මහතාගේ කතාව
   (3) අත්ථස්සද්වාර ජාතකය (4) ස්වර්ණ හංස ජාතකය

19. 'අවුළුපත්' යන ශාසනික වචනයේ තේරුම වන්නේ,
   (1) ජලය (2) අතුරුපස (3) පාන වර්ග (4) බුලත් විට

20. සුවසේ නිදයි, සුවසේ පිබිදෙයි, පාපි සිහින නොදකියි.. යනාදී අනුසස් ලැබෙන්නේ,
   (1) ආනාපානසති භාවනාව වැඩීමෙනි. (2) මෛත්‍රී භාවනාව වැඩීමෙනි.
   (3) පිළිකුල් භාවනාව වැඩීමෙනි. (4) බුදු ගුණ භාවනාව වැඩීමෙනි. (ලකුණු 2x20=40)

Past Papers Wiki

II පත්‍රය

- පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්නයට ලකුණු 20ක් ද, අනෙකුත් ප්‍රශ්නවලට ලකුණු 10 බැගින් ද හිමිවේ.

---

1) i. බුද්ධ කෝලාහලය යනු කුමක් ද?

ii. සිදුහත් කුමරු සමඟ ශාස්ත්‍ර උගත් කුමාරවරුන් දෙදෙනෙක් නම් කරන්න.

iii. අත්ථස්සද්වාර ජාතකයට අනුව දියුණුව සඳහා අවශ්‍ය කරුණු 4ක් ලියන්න.

iv. සම්මා වාචාවල ආකාර සතර මොනවාද?

v. ශ්‍රද්ධාව ප්‍රධාන වශයෙන් දෙයාකාරය. නම් කරන්න.

(ලකුණු 4x5=20)

2) i. විහාරස්ථානයට ගොස් වන්දනාමාන කරන අනුපිළිවෙළ කුමක්ද?

ii. මල් පූජා කරන ගාථාව ලියන්න.

iii. සැදැහැවතෙකු තුළ තිබිය යුතු ලක්ෂණ තුන මොනවාද?

(ලකුණු 2 + 3 + 5 =10)

3) i. ත්‍රිකෝටි පාරිශුද්ධ ශීලය යනු කුමක් ද?

ii. පන්සිල් පද පහෙන් තුනක් සරල බසින් ලියන්න.

iii. විරමනය හා සමාදානය එක් සිල්පදයක් ඇසුරින් පැහැදිලි කරන්න.

(ලකුණු 2 + 3 + 5 =10)

4) i. මස ඇතුළු පිරිස ඉටු කළ සමාජ සේවා කටයුතු මොනවාද?

ii. තමා සතු බලවත් මන්ත්‍රය ලෙස රජතුමා හමුවේ මස මානවකයා පැවසුවේ කුමක් ද?

iii. මස මානවක ආරක්ෂා කළ උතුම් වත් හත මොනවාද?

(ලකුණු 2 + 3 + 5 =10)

5) i. ජාතික කොඩිය පරිහරණයේ දී සැලකිලිමත් විය යුතු කරුණු තුනක් ලියන්න.

ii. සතර බ්‍රහ්ම විහරණ නම් කරන්න.

iii. ජාතික කොඩියෙහි සිටින කහ පැහැති සිංහයාගෙන් විදහා දැක්වෙන අර්ථ ලියන්න.

(ලකුණු 2 + 3 + 5 =10)

6) i. උඳුවප් පොහෝ දින ශ්‍රී ලාංකික බෞද්ධයිනට ශාසනික වශයෙන් වැදගත් වීමට හේතු දෙකක් ලියන්න.

ii. ශ්‍රී ලංකාවේ පැවිදි වූ මුල්ම කාන්තාව කවුද?

iii. දුම්න්දාගමනය සමඟ ශ්‍රී ලංකාවේ සංවර්ධනයක් ඇති වූයේ කුමන ක්ෂේත්‍රවල ද?

(ලකුණු 2 + 3 + 5 =10)

7) පහත සඳහන් මාතෘකාවලින් දෙකක් තෝරා කෙටි සටහන් ලියන්න.

i. ස්වර්ණ හංස ජාතකය

ii. ජාතික පුෂ්පය

iii. පන්සිල් සුරකිමු.

iv. මහින්දාගමනය (ලකුණු 5 x 2 = 10)

PAST PAPERS WIKI

WWW.PastPapers.WiKi

Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Paper Bank